# රට රස්සාවෙන් ජයක් සිහින ඉටුකරන ණයක්!

## විදෙස් රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් පිරිනැමෙන මනුසවි විදෙස් ශ්‍රමික බහුකාර්ය ණය යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා රට රැකියාවකට යන ඔබ වෙනුවෙන්ම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඒකාබද්ධව හඳුන්වාදෙන 'මනුසවි' විදෙස් ශ්‍රමික බහුකාර්ය ණය යෝජනා ක්‍රමයෙන් ඔබේ සිහින පැතුම් ඉටුකර ගන්න. ප්‍රතිමූල්‍ය පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ රාජ්‍ය සහ පෞද්ගලික වාණිජ බැංකු හරහා බහුකාර්ය ණය යෝජනා ක්‍රමයක් ලෙස මෙය ක්‍රියාත්මක වෙයි.

**ප්‍රතිලාභ**

- 8%ක පොලී අනුපාතයක්
- රුපියල් මිලියන 2 දක්වා ණය පහසුකම් ලබාගත හැකියි
- ණය ආපසු ගෙවීමේ කාලය වසර 3 දක්වා
- පුද්ගලික විදේශ විනිමය ගිණුමක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ණය වාරික ගෙවීමේ හැකියාව

**පහත කාර්යයන් සඳහා මෙම ණය මුදල් ලබාගත හැකිය**

- ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කිරීම හෝ පුළුල් කිරීම
- නිවසක් මිලට ගැනීම, ඉදිකිරීම හෝ පුළුල් කිරීම
- ඉඩමක් හෝ වාහනයක් මිලට ගැනීම
- දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා
- වෙනත් ඵලදායි කටයුත්තක් සඳහා

**වෙනත් වැදගත් කරුණු**

- මේ සඳහා තනිවම හෝ ඒකාබද්ධව ණය අයදුම්පත් විදේශගත වීමට ප්‍රථම හෝ විදේශගතව සිටියදී අදාළ බැංකුව වෙත යොමුකළ හැකිය.
- ශ්‍රී ලංකා රුපියල් මඟින් ණය ගෙවීම සිදුකිරීම සඳහා ඉඩ ලබාදී නොමැති අතර, විදේශ සේවා නියුක්තිය අවසන් කර ලංකාවට පැමිණි පසුව පමණක් අදාළ අවස්ථාව ලබා ගත හැකිය. රුපියල් මඟින් ණය පියවීම සිදු කරනු ලබන්නේ නම් වෙළෙඳපොළ පවත්නා පොලී අනුපාතයන් අදාළ කර ගැනීම සිදුකරනු ලැබේ.